# ද්‍රව්‍ය /රූප දෙකෙන් දෙක ගණන් කිරීම



## ක්‍රියාකාරකම 1

**දෙමාපියන් සඳහා උපදෙස්**

එක ඉරටුවකට මල් දෙක බැගින් ඉරටු 10 ක මල් 20 ක් අමුණා ගන්න. එය පහත දැක්වෙන ලෙසට කියවමින් වෙන්කර තැබීමට දරුවාට උදව් කරන්න.

ඉරටු 1 යි මල් 2 යි

ඉරටු 2 යි මල් 4 යි.

ඉරටු 3 යි මල් 6 යි.

..............................................

..............................................

ඉන් පසුව මල් පමණක් 2, 4, 6, 8, 10, ........, 20 තෙක් දෙකෙන් දෙක ගණන් කිරීමට යොමු කරවන්න.



## ක්‍රියාකාරකම 2

පියවර I එකම පාටකින් කොඩි 20 ක් වැලක අමුණන්න.

(කොඩි එහා මෙහා කළ හැකි විය යුතුය.)

කොඩි දෙක බැගින් වැලේ එක් පසෙකට කරමින් 2න් 2ක ගණන් කිරීමට දරුවාට උපදෙස් දෙන්න. පසුව කොඩි 1 බැගින් ගණන් කර පිළිතුර නිවැරදි බව පෙන්වා දෙන්න.

පියවර II බොත්තම් 16ක්, දත් බෙහෙත් මුඩි 18ක්, ගල්කැට 20ක්, වැනි සපයා ගත හැකි ද්‍රව්‍ය දරුවාට ලබා දී දෙකෙන් දෙක ගණන් කරමින් වෙන් කිරීමට උදව් කරන්න.

## ක්‍රියාකාරකම 3

පියවර I මල් 20 ක් ඇඳ හෝ කපා අලවා එය පහසුවෙන් ගණන් කිරීමට හැකි ලෙස දෙකෙන් දෙක වෙන් කිරීමට දරුවා සමඟ සාකච්ඡා කරමින් ක්‍රමයක් යෝජනා කරන්න. (රවුම් කිරීම, යටින් ඉරි ඇඳීම, හරස් ඉරි ඇඳීම හෝ වෙනත් සළකුණක් යෙදීමට දරුවන් යෝජනා කරනු ඇත.)

වෙන් කරන ලද මල් දෙකෙන් දෙක ගණන් කිරීමට යොමු කරන්න.



**පියවර II** පහත දැක්වෙන ආකාරයේ කොටු සැලැස්මක් දරුවාට කඩදාසියක සකස් කර දෙන්න. එහි ඇලවීමට හැකි මල් හෝ කුඩා රවුම් ප්‍රමාණවත් පරිදි දරුවාට ලබා දෙන්න. එක කොටුවක දෙක බැගින් අලවා, එම සංඛ්‍යා කොටු පේළියට ඉදිරියෙන් ලිවීමට දරුවා යොමු කරන්න.

උදා :




- 100 ට අඩු ද්‍රව්‍ය හෝ රූප පමණක් දරුවාට ලබා දී ඉහත ඉගෙන ගත් ආකාරයට දෙකෙන් දෙක වෙන් කරමින් ගණන් කිරීමට දරුවාට අවස්ථාව උදාකර දෙන්න.
- ගණිත වැඩ පොතේ පිටු අංක 107 හි අභ්‍යාසය කිරීමට දරුවා යොමු කරන්න.

